නෙත් FM

5 පහේ පන්තිය

01 1ත් 10ත් අතර ඇති ඔත්තේ ඉලක්කම්වලින් සෑදිය හැකි විශාල ම සංඛ්‍යාව අකුරෙන් ලියන්න.

.....

02 ''හතළිස් නවදහස් අනූ නවයට එකක් එකතු කළ විට ලැබෙන පිළිතුරෙන් පනහක් අඩු කළ විට ලැබෙන පිළිතුර ඉලක්කමෙන් ලියන්න.

.....

03 36 578 සංඛ්‍යාවෙහි දස දහසස්ථානයේ පිහිටි ඉක්කමෙන් නිරූපිත අගය සහ සියයස්ථානයේ පිහිටි ඉලක්කමෙන් නිරූපිත අගය අතර වෙනස කීය ද?

.....

04 A,B හා C යන ස්ථාන තුනක තිබූ පොල් ගෙඩි ගණන පිළිවෙළින් 385, 1650, 98 වේ. එම මුළු පොල් ගෙඩි ගණන සමාන ව ගොඩවල් තුනකට වෙන් කළේ නම් එක් ගොඩක ඇති පොල් ගෙඩි ගණන කීය ද?

.....

05 24 න් $\frac{4}{6}$ ක අගයට 24ක් එකතු කළ විට පිළිතුර කීය ද? .....

06



i. මෙම රූපයේ අඳුරු කර ඇති කොටස දශම සංඛ්‍යාවක් ලෙස ලියන්න.

.....

ii. මෙම රූපයේ අඳුරු නොකළ කොටසින් අඩක් අඳුරු කළේ නම් එම කොටස මුළු රූපයෙන් කවර භාගයක් ද?

.....

07 ඔරලෝසුවක වෙලාව පහ පසුවී මිනිත්තු හතළිහයි නම් එම වේලාව කියවිය හැකි තවත් ක්‍රමයක් ලියන්න.

.....

08 3 kg 80 g සහ 5 kg 60 g එකතු කළ විට ලැබෙන පිළිතුරෙන් අඩක ප්‍රමාණය කොපමණ ද?

..... kg ..... g


09 දී ඇති රෝම සංඛ්‍යාවෙහි පෙර හා පසු සංඛ්‍යා රෝම සංඛ්‍යාවෙන් ම ලියන්න.

..... XIX.....

10 පහත දැක්වෙන හැඩතල යොදා ගෙන සෑදිය හැකි සන වස්තු දෙකෙහි මුහුණත් ගණන අතර වෙනස කීය ද?



.....

11 

මෙම රූපය තුළ ඇති සෘජුකෝණ ගණනත් සෘජුකොණයට වඩා අඩු කෝණ ගණනත් එකතු කළ විට ලැබෙන පිළිතුර කීය ද? .....

12 තරංග, තම නිවසේ සිට උදෑසන පාසල් යන විට හිරු එළිය ඔහුගේ මුහුණට වැටුණි. ඉන්පසු ඔහු තම වම් අත පැත්තට හැරී මද දුරක් ගොස් නැවත හිරුට පිටුපා මද දුරක් ගොස් නතර විය. දැන් ඔහුගේ වම් අත ඇත්තේ කවර දිශාවට ද?

.....

13 වෙළෙඳසැලක තබා ඇති මිල දර්ශනයක කොටසක් පහත දැක්වේ. ඒ ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

ද්‍රව්‍ය	ප්‍රමාණය	මුදල
සහල්	1kg	140.00
සීනි	1kg	100.00
පරිප්පු	1kg	80.00


i. සහල් ග්‍රෑම් 750ක් සඳහා ගෙවිය යුතු මුදල කීය ද? රුපියල් .....

ii. මෙම ද්‍රව්‍ය තුනෙන් ම ග්‍රෑම් 250 බැගින් මිල දී ගැනීමට අවශ්‍ය මුළු මුදල කීය ද?

රුපියල් .....

14 භාජනයක කිරි ලීටර 15ක් තිබුණි. එයින් ලීටර 5 මිලිලීටර 250 ක් විකුණූ පසු ඉතුරු වන කිරි ප්‍රමාණය කොපමණ ද?

ලීටර.....මිලිලීටර.....

15 

(i) කම්බියකින් සාදන ලද රූපයේ දැක්වෙන ත්‍රිකෝණයේ වටේ දිග 12 mකි. දී ඇති තොරතුරු අනුව AC පාදයේ දිග කොපමණ ද?

..... m ..... cm

(ii) මෙම කම්බියෙන් එක හා සමාන සමපාද ත්‍රිකෝණ දෙකක් සෑදුවේ නම් සෑදූ ත්‍රිකෝණයක එක් පාදයක දිග කොපමණ ද?

.....


16 පහතින් ලියා ඇති සංඛ්‍යාවේ සංඛ්‍යාංකය කලාප වෙන් කර ලියන්න.

හතළිස් පන්දහස් හැට තුන - .....

17 දී ඇති සංඛ්‍යාවේ දහසස්ථානයේ ස්ථානීය අගය ලියන්න.

26 480 - .....

18 දී ඇති කොටු ජාලය තුළ තිරස් අතට කොටු 7ක් දිග සිරස් අතට කොටු 5ක් පළල සෘජුකෝණාස්‍රයක් අඳින්න.



19 මිනිසුන් 9 දෙනෙක් දින 5ක දී නිම කරන වැඩක් දින 3කින් නිම කිරීමට අවශ්‍ය මිනිසුන් ගණන කීය ද?

.....

20 2 kg 750 gක් බර තේ කුඩු ප්‍රමාණයකින් 250 g පැකට් කීයක් සෑදිය හැකි ද?

.....

21 වත්තක පහත දී ඇති ආකාරයට පොල් ගස් හා තැඹිලි ගස් සිටුවා ඇත.

පොල් ⟶ පේළියක ගස් 7 බැගින් පේළි 18යි
තැඹිලි ⟶ පේළියක ගස් 9 බැගින් පේළි 23යි

වත්තේ සිටුවා ඇති මුළු පොල් හා තැඹිලි ගස් ගණන කොපමණ ද? .....

22 ළමයාගේ දකුණු අත පැත්තෙන් හා වම් අත පැත්තෙන් ඇති දේවල් ලියන්න.



දකුණු අත පැත්තෙන් .....

වම් අත පැත්තෙන් .....

23 කම්හලක දින 2ක දී නිපදවන ලද ඇඟලුම් ප්‍රමාණයන් දී ඇත.


පළමු දින - 1 904
දෙවන දින - 2 456

දින දෙකේ ම නිපද වූ ඇඟලුම් ප්‍රමාණය කොපමණ ද?

.....

24 දක්වා ඇති භාගය දී ඇති රූපයේ පාට කරන්න.

$\frac{3}{4}$ ⟶



25 රූපයේ $\frac{3}{10}$ ක් අඳුරු කර ඇත.



i. එහි තවත් $\frac{1}{10}$ ක් අඳුරු කරන්න.

ii. දැන් අඳුරු නොවී ඇති ප්‍රමාණය දශම සංඛ්‍යාවක් ලෙස ලියන්න. .....